# සාහිත්‍ය නිර්මාණ විචාරය

**විෂයය** : සිංහල භාෂාව හා සාහිත්‍යය

**ශ්‍රේණිය** : 10

**වාරය** : තුන්වන වාරය

**නිපුණතාව** : **11.0** රසඥතා වර්ධනය සඳහා සාහිත්‍ය නිර්මාණ පරිශීලනය කරයි.

**නිපුණතා මට්ටම** : සාහිත්‍ය නිර්මාණ අධ්‍යයනය කර විචාර හැකියා ප්‍රදර්ශනය කරයි.

**ඉගෙනුම් පල** :
- සාහිත්‍ය නිර්මාණ කියවයි.
- සාහිත්‍ය නිර්මාණ පිළිබඳ අදහස් දක්වයි.
- විවිධ සාහිත්‍ය නිර්මාණ කියවා විචාරයේ යෙදෙයි.
- සාහිත්‍ය රස වින්දනයේ යෙදෙයි.

## ක්‍රියාකාරකම් 1

1) "අවක්තාපි ස්වයං ලොකඃ කාමං කාව්‍යපරීක්ෂකඃ රසපාකානභිඥොපි භොක්තා වෙත්ති න කිං රසම්" මේ ශ්ලෝකයෙන් කියවෙන දේ සාහිත්‍යට සම්බන්ධ වන අයුරු කෙටියෙන් දක්වන්න.
2) විචාරය යනුවෙන් හැඳින්වෙන්නේ කුමක් ද ?
3) සාහිත්‍ය නිර්මාණ කෙබඳු දැයි ප්‍රකාශ කිරීමට අවශ්‍ය වන්නේ කුමන කරුණක් ද ?
4) බස දැන ගැනීමට, භාෂාවේ දැනගත යුතු විවිධාර්ථ පැහැදිලි කරන්න.
5) භාෂාව සූක්ෂ්ම ලෙස පරිහරණය කරන්නේ කවු ද ?
6) රසවත් දේ සමග අහර පිසන්නා සේ කවියා නිර්මාණයක් රසවත් කරගන්නේ කෙසේ ද ?
7) විචාරයේ ප්‍රයෝජන මොනවා ද ?

8) සරච්චන්ද්‍රයන් පවසන පරිදි නියම විචාරකයා හඳුනාගත හැකි ආකාරය කෙසේ ද ?

9) පාඨකයා රස වින්දනයට පෙළඹෙන්නේ කුමන ආකාරයෙන් ද ?

10) සාහිත්‍ය විචාර පිළිබඳ ව පාඩමේ සඳහන් කෘති දෙක නම් කරන්න.

11) ‘පොරෙර් පංචාලි’ නවකතාවේ පරිවර්තන කෘතිය කුමක් ද ?

12) මෙම ග්‍රන්ථයේ රචකයා හා පරිවර්ථකයා නම් කරන්න.

__ක්‍රියාකාරකම් 2__

1) පාඩමේ දැක්වෙන කරුණු ඇසුරින් පහත සඳහන් ප්‍රකාශ හරි නම් (✓) වැරදි නම් (x) ලකුණ යොදන්න.

i. සාහිත්‍ය නිර්මාණ යනු සහෘද මනසේ රසවත් හැඟීම් ඇති කරන ගද්‍ය, පද්‍ය කෘතීන් ය. ( )
ii. ‘සාහිත්‍ය විද්‍යාව’ ග්‍රන්ථය ජී. බී. සේනානායකයන්ගේ ය. ( )
iii. සාහිත්‍යකරුවාගේ ප්‍රතිභාව හා රසිකයාගේ ප්‍රතිභා මැනිය හැකි වන්නේ සාහිත්‍යයේ ගැබ්වන ප්‍රතිභාවෙන් ය. ( )
iv. සාහිත්‍යකරු නිර්මාණයක් කිරීමට තම ප්‍රතිභාව පිළිබඳ පමණක් සැලකිල්ලට ගනියි. ( )
v. රසිකයා සාහිත්‍යකරුවාට වඩා රුචිකත්වය ඇත්තෙකු විය යුතු ය. ( )
vi. බස දන්නා සියලු දෙනා ම කාව්‍යයේ රස විඳිති. ( )
vii. සාහිත්‍යකරුවා තියුණු බුද්ධියක් ඇත්තෙකු නො විය යුතුය. ( )
viii. විචාරයක අන්තර්ගත වන්නේ නිර්මාණ වින්දනය කිරීමෙන් ඇතිවන හැඟීම් ය. ( )
ix. පාඨකයා රස වින්දනයට පෙළඹවීමේ ශක්තිය ඇත්තේ ද එබඳු ම විචාරයෙහි ය. ( )
x. නවකතා කලාව රචනා කළේ එදිරිවීර සරච්චන්ද්‍රයන් ය. ( )

2) පාඩමේ එන පහත දී ඇති වචන අයත් ව්‍යාකරණ වර්ගය ලියන්න

i. බුදින -
ii. නීරස -
iii. පාඨකයා -
iv. තර්කානුකූල -
v. ව්‍යංග්‍යාර්ථය -
vi. අසමත් -
vii. එකිනෙකට -
viii. ආත්මාන්වීක්ෂණය -
ix. රුචි - අරුචි -
x. රසවත් -

3) (අ) පැත්තේ දී ඇති වචනවල අරුත් (ආ) පැත්තෙන් තෝරන්න.

| (අ) | (ආ) |
|---|---|
| i. හෘදයගෝචර | A. වචනයේ මතුපිට අරුත |
| ii. ප්‍රතිභාව | B. හදවතට දැනෙන |
| iii. ව්‍යංග්‍යාර්ථය | C. අපූරු වස්තු නිර්මාණය කිරීම |
| iv. සහෘදයා | D. සැඟවුණු අර්ථය |
| v. විචාරකයා | E. කැමැත්ත |
| vi. රසවින්දනය | F. රසවත් නොවූ |
| vii. සූක්ෂ්ම | G. රසිකයා |
| viii. නීරස | H. නිර්මාණයක් මැනවින් පරීක්ෂා කරන්නා |
| ix. වාච්‍යාර්ථය | I. සියුම් |
| x. රුචිකත්වය | J. රසවත් ලෙස වින්දනය |

<u>බිත්ති පුවත්පත</u>

**නිපුණතාව** : **7.0** භාෂාව නිරවුල් ව හා නිවැරදි ව භාවිත කරමින් ප්‍රායෝගික ලේඛනයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම** : **7.2** ප්‍රායෝගික අවශ්‍යතා සඳහා ලේඛන සකස් කරයි.

**ඉගෙනුම් පල** :
- ප්‍රායෝගික ලේඛන හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- ශිල්පීය ප්‍රයෝගානුකූල ව ප්‍රායෝගික ලේඛන සකස් කරයි.
- අදාළ ලේඛනයට යෝග්‍ය නිර්මාණාත්මක අංග භාවිත කරමින් ප්‍රායෝගික ලේඛනයේ යෙදෙයි.

<u>**ක්‍රියාකාරකම් 1**</u>

1) සාහිත්‍ය රසය දනවන පරිසර වර්ණනයක් ඇසුරින් බිත්ති පුවත්පතට ලිපියක් ලියන්න.

2) මාර්ටින් වික්‍රමසිංහ
   විමල් දිසානායක
   ජී. බී. සේනානායක
   යන සාහිත්‍යකරුවන්ගේ නිර්මාණ රසවින්දන බිත්ති පුවත්පතකට එකතු කරන්න.

## පිළිතුරු

## සාහිත්‍ය නිර්මාණ විචාරය

## ක්‍රියාකාරකම 1

1) අහර පිසින අය, බුදින අය යනුවෙන් ඇති දෙකොටසට මෙන් නිර්මාණය කරන අය හා රස විඳින අය ද කොටස් දෙකකි.
2) කාව්‍ය රසය සම්බන්ධයෙන් එය විඳින්නන් කරනු ලබන ප්‍රකාශනයට ය.
3) ආත්මාන්වීක්ෂණය
4) ව්‍යංග්‍යාර්ථ හා හෘදයගෝචරවීමයි.
5) කවීන් ය.
6) පෙර නුවූ විරූ ව්‍යංග්‍යාර්ථ, ශබ්ද ධ්වනි ඇති කර රසයක් නිර්මාණයට එක් කිරීම.
7) සාමාන්‍ය පාඨකයාට නොපෙනෙන දේ කවි බස හැදෑරූ අයට පෙනේ. එය පොදු ලෝකයාටත් රසවින්දනයක් ඇති කරයි.
8) නීරස නොවූ රසවත් දේ පවසන අය නියම විචාරකයෝ ය.
9) රසයෙහි ආවිෂ්ට වී කරන විචාරයට පමණි.
10) 
    - සාහිත්‍ය විද්‍යාව
    - නවකතා කලාව
11) මාවතේ ගීතය
12) 
    - විභූති භූෂණ බන්දොපාධ්‍යායගේ
    - චින්තා ලක්ෂ්මී සිංහාරච්චි

## ක්‍රියාකාරකම 2

1) .
   i. ✓
   ii. X
   iii. ✓
   iv. X
   v. X
   vi. X
   vii. X
   viii. ✓
   ix. ✓
   x. X

2) .
   i. කෘදන්ත
   ii. උපසර්ග
   iii. විභක්ති

iv. සන්ධි
v. තනිපද
vi. උපසර්ග
vii. සන්ධි
viii. තනිපද
ix. යුගල පද
x. තද්ධිත

3) .

i. B
ii. C
iii. D
iv. G
v. H
vi. J
vii. I
viii. F
ix. A
x. E

කේ. මයුරී කුමාරරත්න

ශ්‍රී සුමංගල විද්‍යාලය, පානදුර